# ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
## දෛනිකව රෝහලෙන් ඉවත් කරනු ලබන ඉඳුල් ආහාර සඳහා මිල ගණන් කැඳවීම

1. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ දෛනිකව ඉවත් කරනු ලබන ඉඳුල් ආහාර මිලදී ගැනීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

| | අංකය | අයිතමය | ඒකක ගණන | ආපසු නොගෙවනු ලබන තැන්පතු මුදල | ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|
| 01 | Q 54/25 | දෛනිකව රෝහලෙන් ඉවත් කරනු ලබන ඉඳුල් ආහාර | තොගය | රු. 1,000.00 | රු. 10,000.00 |

2. ඉහත සඳහන් මුදල් ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මුදල් අයකැමි වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පතේ පිටපතක් රෝහලේ සැපයුම් අංශය වෙත ඉදිරිපත් කර අදාල විස්තර සහිත ලංසු ලේඛන ලබා ගත හැකිය. අදාල ලංසු ලේඛන 13/02/2025 දින සිට 25/02/2025 දින දක්වා සතියේ වැඩ කරන දින වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැකිය.

3. සියලුම ටෙන්ඩර් මිල ගණන් මුද්‍රා තබන ලද කවරයක බහා රෝහලේ සභාපති කාර්යාලය අසල ඇති ටෙන්ඩර් පෙට්ටියට 27/02/2025 දින පෙ.ව. 10.00ට පෙර බහාලිය හැකි අතර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්ද 27/02/2025 පෙ.ව. 10.00ට පෙර ලැබෙන සේ යොමු කල හැකිය. ටෙන්ඩර් පත් විවෘත කිරීම 27/02/2025 දින පෙ.ව. 10.00ට රෝහල් රැස්වීම් ශාලාවේදී සිදුකරනු ලැබේ. අදාල කවරයේ වම්පස ඉහල කෙලවරේ ටෙන්ඩරයේ නම (දෛනිකව රෝහලෙන් ඉවත් කරනු ලබන ඉඳුල් ආහාර සඳහා මිල ගණන් කැඳවීම) සහ අංකය සහ දිනය සඳහන් කල යුතුය. අයදුම්කරුවන්ට එම අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. අදාල ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

5. වැඩි විස්තර රෝහලේ සැපයුම් අංශය වෙතින් ලබාගත හැකිය.

දුරකථන අංකය : 011-2778610 - දිගුව:3142 හෝ 011-2778624

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,
තලපත්පිටිය, නුගේගොඩ.

